# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1127/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 09/07/2024
පැය 1345

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.07.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 35 | 345 | බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. කේරළ ගංජා තොගයක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර .**

2024.07.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අඩම්පන් පොලිස් වසමේ වෙඩිතලතිව් ප්‍රදේශයේ වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 10 ග්‍රෑම් 365 ක් අඩංගු පාර්සල් 05 ක් සොයාගෙන අඩම්පන් පොලිසිය වෙත භාර දී ඇත.

සැකකරුවන් සම්බන්ධයෙන් කරුණු අනාවරණ වී නොමැති අතර මොවුන් අත්අඩංගුවට ගැනීම සඳහා අඩම්පන් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. රක්ෂිතයකට අනවසරයෙන් ඇතුළු වී බලපත්‍ර නොමැතිව ප්‍රදේශයක් එළිපෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.**

2024.07.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කුච්චවේලි පොලිස් වසමේ මඩුවාකුලම් රක්ෂිත ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වී බලපත්‍ර නොමැතිව අක්කර තුනහමාරක ප්‍රදේශයක් එළිපෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කුඹුරුපිටිය අඩවි වන කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වූ කුඹුරුපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.**

2024.07.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පස්සර පොලිස් වසමේ පස්සර ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන පස්සර පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 37 ක් වූ පස්සර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. පස්සර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර.**

2024.07.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැලිපැන්න පොලිස් වසමේ දර්ගානගරය ප්‍රදේශයේ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 600 ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන අළුත්ගම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 18 ක් වූ දර්ගානගරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. අළුත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**